# S ගොනුවේ රසායනය

**"S" ගොනුවේ මූල ද්‍රව්‍ය:**

ආවර්තිතා වගුවේ **IA** හා **IIA** කාණ්ඩ වල මූල ද්‍රව්‍ය **"S"** ගොනුවට අයත් වේ.

| I A | II A |
|---|---|
| $_1$**H** | |
| $_3$**Li** | $_4$**Be** |
| $_{11}$**Na** | $_{12}$**Mg** |
| $_{19}$**K** | $_{20}$**Ca** |
| $_{37}$**Rb** | $_{38}$**Sr** |
| $_{55}$**Cs** | $_{50}$**Ba** |
| $_{87}$**Fr** | $_{88}$**Ra** |

I A කාණ්ඩයේ මූල ද්‍රව්‍ය වල පොදු වින්‍යාසය

(උච්ච වායු වින්‍යාසය) $n\,s^1$

II A කාණ්ඩයේ මූල ද්‍රව්‍ය වල පොදු වින්‍යාසය

(උච්ච වායු වින්‍යාසය) $n\,s^2$

**"S"ගොනුවේ මූල ද්‍රව්‍ය වල ස්වභාවික පැවැත්ම:**

| මූල ද්‍රව්‍ය | ස්වභාවික පැවැත්ම | |
|---|---|---|
| Na | $NaCl$ | බ්‍රයින් |
| | $NaNO_3$ | චිලිසෝල්ට්පීටර් |
| | $Na_3AlF_6$ | ක්‍රයොලයිට් |
| K | $KCl$ | සිල්වයින් |
| | $KNO_3$ | නයිටර් |
| | $K_2O.Al_2O_3.6SiO_2$ | ෆෙල්ඩ්ස්පාර් ($KAlSi_3O_8$) |
| | $KCl.MgCl_2.6H_2O$ | කානලයිට් |
| Mg | $MgCO_3$ | මැග්නසයිට් |
| | $MgCO_3.CaCO_3$ | ඩොලමයිට් |
| | $KCl.MgCl_2.6H_2O$ | කානලයිට් |
| | $MgSO_4.7H_2O$ | එප්සොමයිට් |
| Ca | $CaCO_3$ | කැල්සයිට්, හුණුගල්, කොරල් |
| | $CaCO_3.MgCO_3$ | ඩොලමයිට් |
| | $CaF_2.3Ca_3(PO_4)_2$ | ඇපටයිට් ($Ca_5(PO_4)_3F$) |
| | $CaSO_4.2H_2O$ | ජිප්සම් |

**"S" ගොණුවේ මූලද්‍රව්‍ය නිස්සාරණය:**

**Na නිස්සාරණය:**

නිර්ජලීය පිරිසිදු ඝන NaCl විලීන කොට විද්‍යුත් විච්ඡේදනයෙන් Na නිස්සාරණය කරයි.

$NaCl(s) \xrightarrow{\text{විලීන කිරීම}} NaCl(l) \longrightarrow$ වි.විච්ඡේදනය

කැතෝඩය අසල

$Na^+ + e \longrightarrow Na$

ඇනෝඩය අසල

$2Cl^- \longrightarrow Cl_2 + 2e$

Find more at: chemistrysabras.weebly.com
twitter: ChemistrySabras

**K නිස්සාරණය:**

නිර්ජලීය පිරිසිදු KCl විලීන කොට විද්‍යුත් විච්ඡේදනයෙන් K නිස්සාරණය කරයි.

$KCl(s) \xrightarrow{\text{විලීන කිරීම}} KCl(l) \longrightarrow$ වි.විච්ඡේදනය

කැතෝඩය අසල

$K^+ + e \longrightarrow K$

ඇනෝඩය අසල

$2Cl^- \longrightarrow Cl_2 + 2e$

**Mg නිස්සාරණය:**

01. මැග්නසයිට් ($MgCO_3$) මගින් Mg නිස්සාරණය:

$$MgCO_3 \underset{\Delta}{\rightleftharpoons} MgO + CO_2$$

$$MgO + C + Cl_2 \xrightarrow[\Delta]{} MgCl_2 + CO$$

$MgCl_2(s) \xrightarrow{\text{විලීන කිරීම}} MgCl_2(l) \longrightarrow$ වි.විච්ඡේදනය

කැතෝඩය අසල

$Mg^{2+} + 2e \longrightarrow Mg$

ඇනෝඩය අසල

$2Cl^- \longrightarrow Cl_2 + 2e$

02. කානලයිට් ($KCl.MgCl_2.6H_2O$) මගින් Mg නිස්සාරණය

$$KCl.MgCl_2.6H_2O \xrightarrow{H_2O} K^+(aq) + Mg^{2+}(aq) + 3Cl^-(aq)$$

$$Mg^{2+}(aq) + 2OH^-(aq) \longrightarrow Mg(OH)_2(s)$$

$$Mg(OH)_2(s) + 2HCl(g) \xrightarrow[\Delta]{} MgCl_2(s) + 2H_2O(l)$$

$MgCl_2(s) \xrightarrow{\text{විලීන කිරීම}} MgCl_2(l) \longrightarrow$ වි.විච්ඡේදනය

කැතෝඩය අසල

$Mg^{2+} + 2e \longrightarrow Mg$

ඇනෝඩය අසල

$2Cl^- \longrightarrow Cl_2 + 2e$

03. ඩොලමයිට් ($CaCO_3.MgCO_3$) මගින් Mg නිස්සාරණය

$$MgCO_3.CaCO_3(s) + 4HCl(aq) \longrightarrow Mg^{2+}(aq) + Ca^{2+}(aq) + 4Cl^-(aq) + 2CO_2 + 2H_2O$$

$$Mg^{2+}(aq) + 2OH^-(aq) \longrightarrow Mg(OH)_2(s)$$

$$Mg(OH)_2(s) + 2HCl(g) \xrightarrow[\Delta]{} MgCl_2(s) + 2H_2O$$

Find more at: chemistrysabras.weebly.com
twitter: ChemistrySabras

$MgCl_2(s)$ —විලීන කිරීම→ $MgCl_2(l)$ ——→ වි.විච්ඡේදනය

කැතෝඩය අසල

$Mg^{2+} + 2e \longrightarrow Mg$

ඇනෝඩය අසල

$2Cl^- \longrightarrow Cl_2 + 2e$

**Ca නිස්සාරණය**

01.කැල්සයිට් ($CaCO_3$) මඟින් Ca නිස්සාරණය

$CaCO_3(s) \rightleftharpoons CaO(s) + CO_2(g)$

$CaO(s) + C(s) + Cl_2(s) \xrightarrow{\Delta} CaCl_2(s) + CO(g)\uparrow$

$CaCl_2(s)$ —විලීන කිරීම→ $CaCl_2(l)$ වි.විච්ඡේදනය

කැතෝඩය අසල

$Ca^{2+} + 2e \longrightarrow Ca$

ඇනෝඩය අසල

$2Cl^- \longrightarrow Cl_2 + 2e$

02. ඩොලමයිට් ($MgCO_3.CaCO_3$) මඟින් Ca නිස්සාරණය

$MgCO_3.CaCO_3(s) + 4HCl(aq) \longrightarrow Ca^{2+}(aq) + Mg^{2+}(aq) + 4Cl^-(aq) + 2CO_2\uparrow + 2H_2O$

$4Cl^- + Ca^{2+} + Mg^{2+} + 2NH_4OH \longrightarrow Mg(OH)_2\downarrow + 2NH_4^+(aq) + Ca^{2+}(aq) + 4Cl^-(aq)$

පෙරනය රත් කිරීම

$Ca^{2+}(aq) + 4Cl^-(aq) + 2NH_4^+(aq)$ $CaCl_2(s) + 2NH_3(g) + 2HCl\uparrow$

$CaCl_2(s)$ —විලීන කිරීම→ $CaCl_2(l)$ ——→ වි.විච්ඡේදනය

කැතෝඩය අසල

$Ca^{2+} + 2e \longrightarrow Ca$

ඇනෝඩය අසල

$2Cl^- \longrightarrow Cl_2 + 2e$

**"S" ගොණුවේ මූලද්‍රව්‍ය වල ගුණ:**

I A හා II A කාණ්ඩ වල පිහිටි මූල ද්‍රව්‍ය වල කාණ්ඩයේ පහළට යන විට පරමාණුක අරය වැඩි වේ.

| මූල ද්‍රව්‍ය | ලෝහක අරය/$^0$A | මූල ද්‍රව්‍ය | ලෝහක අරය/$^0$A |
|---|---|---|---|
| Li | 1.52 | Be | 1.11 |
| Na | 1.86 | Mg | 1.6 |

Find more at: chemistrysabras.weebly.com
twitter: ChemistrySabras

| | | | |
|---|---|---|---|
| K<br>Rb<br>Cs | 2.27<br>2.48<br>2.65 | Ca<br>Sr<br>Ba | 1.97<br>2.15<br>2.17 |

- I A හා II A කාණ්ඩ වල පිහිටි මූල ද්‍රව්‍යයන්හි කාණ්ඩයේ පහළට යන විට ප්‍රථම අයණීකරණ ශක්තිය අඩු වේ.
- මෙම මූල ද්‍රව්‍යයන්හි කාණ්ඩයේ පහළට යන විට ඝනත්වය වැඩි වේ.
- මෙම මූලද්‍රව්‍ය සෑම එකක්ම ලෝහක ආකෘති සාදන නිසා හොඳ ලෝහ වේ.
- I A කාණ්ඩයේ මූල ද්‍රව්‍ය මඟින් සාදන ලෝහක බන්ධනයේ ප්‍රභලතාව අඩුය. මෙයට හේතු 2කි.
    1. කැටායනයේ විශාලත්වය වැඩි වීම.
    2. ඉලෙක්ට්‍රෝන තටාකයේ ඝනත්වය අඩු වීම.




- මේ නිසා I A කාණ්ඩයේ මූලද්‍රව්‍ය මෘදු වන අතර ශක්තිමත් බවින් අඩුය. ද්‍රවාංක හා තාපාංක අඩුය.
- II A කාණ්ඩයේ මූලද්‍රව්‍ය මඟින් සාදන ලෝහක බන්ධනයේ ප්‍රභලතාව වැඩිය. මෙයට හේතු 2කි.
    1. කැටායනයේ විශාලත්වය අඩු වීම.
    2. ඉලෙක්ට්‍රෝන තටාකයේ ඝණත්වය වැඩි වීම.

Find more at: chemistrysabras.weebly.com
twitter: ChemistrySabras




- මේ නිසා II A කාණ්ඩයේ මූල ද්‍රව්‍ය වල ද්‍රවාංක සහ තාපාංක සාපේක්ෂව වැඩිය.

| මූල ද්‍රව්‍ය | ද්‍රවාංකය/$^0C$ | මූල ද්‍රව්‍ය | ද්‍රවාංකය/$^0C$ |
|---|---|---|---|
| Li | 181 | Be | 1200 |
| Na | 98 | Mg | 650 |
| K | 63 | Ca | 839 |
| Rb | 39 | Sr | 768 |
| Cs | 28.5 | Ba | 727 |

Na, K වැනි ලෝහ වේගයෙන් වාතය, ජලය සමඟ ප්‍රතික්‍රියා කරන නිසා ගබඩා කර තැබීම සඳහා භූමි තෙල් භාවිතා කරයි.

**“S” ගොනුවේ මූල ද්‍රව්‍ය වල රසායනික ප්‍රතික්‍රියා:**

| ප්‍රතිකාරකය | I කාණ්ඩය | II කාණ්ඩය |
|---|---|---|
| වාතය | Li හැරුණු විට අනෙක් මූල ද්‍රව්‍ය වේගයෙන් ප්‍රතික්‍රියා කරයි. වාතයේ ඇති $O_2$ හා ජල වාෂ්ප සමඟ කෙලින්ම ප්‍රතික්‍රියා කරයි. $N_2$ සමඟ ප්‍රතික්‍රියා නොකරයි. Li පමණක් $N_2$ සමඟ ප්‍රතික්‍රියා කරයි. | සාමාන්‍ය තත්ව යටතේ සෙමින් ප්‍රතික්‍රියා කරයි. රත් කිරීමේදී වාතයේ ඇති $O_2$ හා $N_2$ සමඟ ප්‍රතික්‍රියා කරයි. |
| $O_2$ සමඟ | $4Li + O_2 \longrightarrow 2Li_2O$<br>$2Na + O_2$(වැඩිපුර) $\longrightarrow Na_2O_2$ පෙරොක්සයිඩ<br>$K + O_2 \longrightarrow KO_2$(සුපර් ඔක්සයිඩ)<br>$Rb + O_2 \longrightarrow RbO_2$ | $2M + O_2 \longrightarrow 2MO$<br>Ba පමණක්,<br>$Ba + O_2 \longrightarrow BaO_2$<br>(පෙරොක්සයිඩ) |
| $N_2$ සමඟ | $6Li + N_2 \longrightarrow 2Li_3N$<br>(Li පමණක් නයිට්‍රයිඩ සාදයි.) | $3M + N_2 \longrightarrow M_3N_2$<br>(නයිට්‍රයිඩ) |
| $H_2$ සමඟ | $2M + H_2 \longrightarrow 2MH$<br>(අයණික හයිඩ්‍රයිඩ) | $M + H_2 \longrightarrow MH_2$<br>(අයණික හයිඩ්‍රයිඩ) |
| P සමඟ | $3M + P \longrightarrow M_3P$(පොස්පයිඩ) | $3M + 2P \longrightarrow M_3P_2$(පොස්පයිඩ) |
| S සමඟ | $2M + S \longrightarrow M_2S$(සල්පයිඩ) | $M + S \longrightarrow MS$ (සල්පයිඩ) |

Find more at: chemistrysabras.weebly.com
twitter: ChemistrySabras

| | | |
|---|---|---|
| හැලජන සමඟ | $2M + X_2 \longrightarrow 2MX$ (හේලයිඩ) | $M + X_2 \longrightarrow MX_2$ (හේලයිඩ) |
| $H_2O$ සමඟ | $Li + H_2O_{(g)} \longrightarrow Li_2O + H_2$<br><br>අනෙක් ලෝහ වේගයෙන් $H_2O$ සමඟ ප්‍රතික්‍රියා කරයි.<br><br>$2Na + H_2O(g) \longrightarrow 2NaOH + H_2$<br>$2K + H_2O(g) \longrightarrow 2KOH + H_2$ | Be + H2O $\longrightarrow$ BeO + H2<br><br>සිසිල් ජලය සමඟ සෙමින්ද අනෙක් ලෝහ වේගයෙන්ද ප්‍රතික්‍රියා කරයි.<br><br>$Mg + 2H_2O_{(g)} \longrightarrow Mg(OH)_2 + H_2$<br>$Ca + 2H_2O_{(g)} \longrightarrow Ca(OH)_2 + H_2$<br>$Sr + 2H_2O_{(g)} \longrightarrow Sr(OH)_2 + H_2$<br>$Ba + 2H_2O_{(g)} \longrightarrow Ba(OH)_2 + H_2$ |
| HCl සමඟ | ස්ඵෝටන ශෙන දෙයි.<br>$2M + 2HCl \longrightarrow 2MCl + H_2$ | $M + 2HCl \longrightarrow MCl_2 + H_2$ |

**Na වාතයේ සංඝටක මත සිදු කරන ප්‍රතික්‍රියා:**

(i) $4Na + O_2 \longrightarrow 2Na_2O$

(ii) $2Na + O_2 \longrightarrow Na_2O_2$

(iii) $2Na + 2H_2O \longrightarrow 2Na_2O + H_2$

(iv) $Na_2O + CO_2 \longrightarrow Na_2CO_3$

(v) $Na_2O + H_2O \longrightarrow 2NaOH$

(vi) $2NaOH + CO_2 \longrightarrow Na_2CO_3 + H_2O$

(vii) $Na_2CO_3 + H_2O + CO_2 \longrightarrow 2NaHCO_3$

**"S" ගොනුවේ කැටායන නොයෙක් ඇනායන සමඟ මිශ්‍ර කිරීම**

මෙහිදී ජලය තුළ අවක්ෂේප වන සංයෝග **√** ලෙසද අවක්ෂේප නොවන සංයෝග **×** ලෙසද දක්වා ඇත.

| ඇනායනය / කැටායනය | $OH^-$ | $CO_3^{2-}$ | $SO_4^{2-}$ | $CrO_4^{2-}$ | $PO_4^{3-}$ | $C_2O_4^{2-}$ |
|---|---|---|---|---|---|---|
| $Na^+$ | × | × | × | × | × | × |
| $K^+$ | × | × | × | × | × | × |
| $Mg^{2+}$ | √ | √ | × | × | √ | × |
| $Ca^{2+}$ | × | √ | √ | × | √ | √ |
| $Sr^{2+}$ | × | √ | √ | × | √ | √ |
| $Ba^{2+}$ | × | √ | √ | √ | √ | √ |

- "S" ගොනුවේ ක්ලෝරයිඩ, බ්‍රෝමයිඩ, අයඩයිඩ සෑම එකක්ම ජලයේ දිය වේ.
- ඕනෑම නයිට්‍රේටයක් ජලයේ දිය වේ.

Find more at: chemistrysabras.weebly.com
twitter: ChemistrySabras

| සංයෝග කොටස්ශය | ජලයේ දිය වන | ජලයේ දිය නොවන |
|---|---|---|
| කාබනේට | $Na_2CO_3$, $K_2CO_3$, $Rb_2CO_3$, $Cs_2CO_3$, $Fr_2CO_3$, $(NH_4)_2CO_3$ | අනෙක් කාබනේට |
| ක්ලෝරයිඩ | අනෙක් ක්ලෝරයිඩ | $AgCl$, $PbCl_2$, $CuCl$, $Hg_2Cl_2$ |
| සල්ෆේට | අනෙක් සල්ෆේට | $CaSO_4$, $SrSO_4$, $Ag_2SO_4$, $BaSO_4$, $PbSO_4$ |

- I A කාණ්ඩයේ මූල ද්‍රව්‍යයන්හි සෑම සංයෝගයක්ම ජලයේ දිය වේ.
- II A කාණ්ඩයේ සල්ෆේට සහ පොස්ෆේට වල ජල ද්‍රාව්‍යතාව කාණ්ඩයේ පහළට අඩු වේ.
- II A කාණ්ඩයේ හයිඩ්‍රොක්සයිඩ වල ජල ද්‍රාව්‍යතාව කාණ්ඩයේ පහළට වැඩි වේ. එම නිසා ඒවායේ භාෂ්මික ප්‍රභලතාවයද කාණ්ඩයේ පහළට වැඩි වේ.

**කාබනේට වියෝජනය**

- රත් කිරීමේදී වියෝජනය නොවන කාබනේට 5කි. $Na_2CO_3$, $K_2CO_3$, $Rb_2CO_3$, $Cs_2CO_3$, $Fr_2CO_3$
- ඉහත කාබනේට හැර අන් සෑම කාබනේටයක්ම රත් කිරීමේදී වියෝජනය වේ. එහිදී ඔක්සයිඩය සාදමින් $CO_2$ පිට කරයි.

$$MgCO_3 \xrightleftharpoons{\Delta} MgO + CO_2$$

$$CaCO_3 \xrightleftharpoons{\Delta} CaO + CO_2$$

- ඇමෝනියම් කාබනේට් රත් කිරීමේදී $NH_3$, $CO_2$ හා $H_2O$ සාදයි.

$$(NH_4)_2CO_3 \rightleftharpoons NH_3 + CO_2 + H_2O$$

- II A කාණ්ඩයේ කාබනේට වල විඝටන උෂ්ණත්වය කාණ්ඩයේ පහළට වැඩි වන බැවින් ඒවයේ තාප ස්තායීථාව කාණ්ඩයේ පහළට වැඩි වේ.
- ඕනෑම කබනේටයක් අම්ල සමඟ ප්‍රතික්‍රියා කර $CO_2$ පිට කරයි.

$$CO_3^{2-} + 2H^+ \longrightarrow CO_2 + H_2O$$

**බයිකාබනේට වියෝජනය**

- ඕනෑම බයිකාබනේටයක් රත් කිරීමේදී කාබනේටය බවට පත් වෙමින් $CO_2$ හා $H_2O$ සාදයි.

$$2HCO_3^- \longrightarrow CO_3^{2-} + CO_2 + H_2O$$

- බොහෝ බයිකාබනේට ජලයේ දිය වේ.
- **ජලයේ ද්‍රාව්‍ය** II A කාණ්ඩයේ බයිකාබනේට රත් කිරීමේදී **ජලයේ අද්‍රාව්‍ය** කාබනේට ඇති වේ.

$$Mg(HCO_3)_2(aq) \longrightarrow MgCO_3\downarrow + CO_2\uparrow + H_2O$$

$$CO(HCO_3)_2(aq) \longrightarrow CaCO_3\downarrow + CO_2\uparrow + H_2O$$

**නයිට්‍රේට වියෝජනය**

Find more at: chemistrysabras.weebly.com
twitter: ChemistrySabras

- $LiNO_3$ හරුණු විට I A කාණ්ඩයේ අනෙකුත් නයිට්‍රේට ඉහළ උෂ්ණත්ව වලට රත් කිරීමේදී වියෝජනය වී නයිට්‍රයිටය සාදමින් $O_2$ පිට කරයි.

$$2NaNO_3 \xrightarrow{\Delta} 2NaNO_2 + O_2$$

$$2KNO_3 \xrightarrow{\Delta} 2KNO_2 + O_2$$

$$2RbNO_3 \xrightarrow{\Delta} 2RbNO_2 + O_2$$

$$2CsNO_3 \xrightarrow{\Delta} 2CsNO_2 + O_2$$

$$2FrNO_3 \xrightarrow{\Delta} 2FrNO_2 + O_2$$

ඉහත නයිට්‍රේට හැර අනෙකුත් නයිට්‍රේට රත් කිරීමේදී ඔක්සයිඩය සාදමින් $NO_2$ හා $O_2$ පිට කරයි.

$$Mg(NO_3)_2 \xrightarrow{\Delta} MgO + 2NO_2 + 1/2O_2$$

$$Cu(NO_3)_2 \xrightarrow{\Delta} CuO + 2NO_2 + 1/2O_2$$

$NH_4NO_3$ රත් කිරීමේදී $NO_2$ හා $H_2O$ සාදයි.

$$NH_4NO_3 \xrightarrow{\Delta} N_2O_{(g)} + 2H_2O$$

(සිනහ වායුව)

**ඔක්සයිඩ වර්ගීකරණය**

1. ආම්ලික ඔක්සයිඩ
2. භාෂ්මික ඔක්සයිඩ
3. උභයගුණී ඔක්සයිඩ
4. උදාසීන ඔක්සයිඩ

**01. ආම්ලික ඔක්සයිඩ**

භෂ්ම සමඟ ප්‍රතික්‍රියා කරයි. ජලයේ දිය වී ආම්ලික ද්‍රාවණ සාදයි. ප්‍රධාන වශයෙන් අලෝහ වල ඔක්සයිඩ මෙම ඝනයට වැටේ.

උදා: $CO_2$, $SiO_2$, $N_2O_5$, $P_2O_3$, $SO_2$, $SO_3$, $Cl_2O$

$H_2O$ සමඟ ප්‍රතික්‍රියාව

$$Cl_2O_7 + H_2O \longrightarrow 2HClO_4$$

$$P_2O_5 + H_2O \longrightarrow 2H_3PO_4$$

$$N_2O_5 + H_2O \longrightarrow 2HNO_3$$

$$2NO_2 + H_2O \longrightarrow HNO_3 + HNO_2$$

භෂ්ම සමඟ ප්‍රතික්‍රියාව

Find more at: chemistrysabras.weebly.com
twitter: ChemistrySabras

$Cl_2O_7 + 2NaOH \longrightarrow 2NaClO_4 + H_2O$

$P_2O_5 + 6NaOH \longrightarrow 2Na_3PO_4 + 3H_2O$

$N_2O_5 + 2NaOH \longrightarrow 2NaNO_3 + H_2O$

$2NO_2 + 2NaOH \longrightarrow NaNO_3 + NaNO_2 + H_2O$

**02. භාෂ්මික ඔක්සයිඩ**

අම්ල සමඟ ප්‍රතික්‍රියා කරයි. සමහරක් ජලයේ දිය වී භාෂ්මික ද්‍රාවණ සාදයි. උභයගුණී නොවන ලෝහ වල ඔක්සයිඩ මෙම ඝනයට වැටේ.

උදා: NaO, $K_2O$, CaO, MgO, BaO, MnO, FeO

$H_2O$ සමඟ ප්‍රතික්‍රියාව:

$Na_2O + H_2O \longrightarrow 2NaOH$

$k_2O + H_2O \longrightarrow 2kOH$

$BaO + H_2O \longrightarrow Ba(OH)_2$

අම්ල සමඟ ප්‍රතික්‍රියාව:

$Na_2O + 2HCl \longrightarrow 2NaCl + H_2O$

$k_2O + 2HCl \longrightarrow 2kCl + H_2O$

$BaO + 2HCl \longrightarrow 2BaCl_2 + H_2O$

**03. උභයගුණී ඔක්සයිඩ:**

අම්ල මෙන්ම භෂ්ම සමඟද ප්‍රතික්‍රියා කරයි. ජලයේ දිය නොවේ. උභය ගුණී ලෝහ වල ඔක්සයිඩ මෙම ඝනයට වැටේ.

උදා:$Al_2O_3$, ZnO, PbO, SnO, $As_2S_3$, BeO

අම්ල සමඟ ප්‍රතික්‍රියාව

$Al_2O_3 + 6HCl \longrightarrow 2AlCl_3 + H_2O$

$ZnO + 2HCl \longrightarrow ZnCl_2 + H_2O$

$PbO + 2HCl \longrightarrow PbCl_2 + H_2O$

භෂ්ම සමඟ ප්‍රතික්‍රියාව

$Al_2O_3 + 2NaOH \longrightarrow 2NaAlO_2 + H_2O$

Find more at: chemistrysabras.weebly.com
twitter: ChemistrySabras

$ZnO + 2NaOH \longrightarrow 2Na_2ZnO_2 + H_2O$

$PbO + 2NaOH \longrightarrow Na_2PbO_2 + H_2O$

**04.** උදාසීන ඔක්සයිඩ

අම්ල මෙන්ම හෂ්ම සමඟද ප්‍රතික්‍රියා නොකරයි. ජලය තුලද දිය නොවේ.

උදා: NO, $N_2O$, CO

**ආවර්තිතා චක්‍රයේ දෙවන සහ තුන් වන ආවර්ත වල හයිඩ්‍රයිඩ:**

| හයිඩ්‍රයිඩ | LiH<br>NaH | $BeH_2$<br>$MgH_2$ | $B_2H_6$<br>$AlH_3$ | $CH_4$<br>$SiH_4$ | $NH_3$<br>$PH_3$ | $H_2O$<br>$H_2S$ | HF<br>HCl |
|---|---|---|---|---|---|---|---|
| බන්ධන ස්වහාවය | අයණික | අයණික | සහ සංයුජ | සහ සංයුජ | සහ සංයුජ | සහ සංයුජ | සහ සංයුජ |
| ජලය සමඟ | $NaH+H_2O$<br>$\downarrow$<br>$NaOH+H_2$ | MgH2+ H2O<br>$\downarrow$<br>$Mg(OH)_2+H_2$ | – | – | $NH_3+H_2O$<br>$\rightleftharpoons$<br>$NH_4OH$<br>හොඳින් දිය වේ. | $H_2S+H_2O$<br>$\rightleftharpoons$<br>$H_3O^++HS^-$<br>සුළු වශයෙන් දිය වේ. | $HCl+H_2O$<br>$\downarrow$<br>$H_3O^++Cl^-$ |
| ආම්ලික/ හාෂ්මික ස්වහාවය | හාෂ්මික | හාෂ්මික | උදාසීන | උදාසීන | $H_2S$ දුබල හාෂ්මික | දුර්වල ආම්ලික | HCl ප්‍රභල ආම්ලික |

- ආවර්තිතා චක්‍රයේ 3වන ආවර්තයේ හයිඩ්‍රයිඩ වල ආම්ලික ස්වහාවය ආවර්ත දිගේ දකුණට වැඩි වන අතර හාෂ්මික ස්වහාවය අඩු වේ. මෙය පහත අයුරින් පැහදිලි කළ හැක.

**හයිඩ්‍රයිඩය M ——H ලෙස සැළකූ විට**

M හි විද්‍යුත් සෘණතාව H වලට වඩා අඩු නම්, M —H බන්ධනය පහත ආකාරයට ධ්‍රැවීකරණය වී $H_2O$ සමඟ ප්‍රතික්‍රියා කර මාධ්‍යයට $OH^-$ සපයයි.

$$M—H + H—O—H \longrightarrow M^+ + OH^- + H_2$$

එවිට හයිඩ්‍රයිඩය හාෂ්මික වේ.

උදා: ආවර්තයේ වම් පස පිහිටි NaH ජලීය ද්‍රාවණයකදී පහත ආකාරයට $OH^-$ සාදන නිසා එය හාෂ්මික වේ.

$$NaOH + H_2O \longrightarrow Na^+ + OH^- + H_2\uparrow$$

M හි විද්‍යුත් සෘණතාව H වලට වඩා වැඩි නම් M—H බන්ධනය පහත ආකාරයට ධ්‍රැවීකරණය වී මාධ්‍යයට $H_3O^+$ සපයයි.

Find more at: chemistrysabras.weebly.com
twitter: ChemistrySabras

$$M—H + H_2O \longrightarrow H_3O^+ + M^-$$

එවිට හයිඩ්‍රයිඩය ආම්ලික වේ.

උදා: ආවර්තයේ දකුණු පස පිහිටි HCl ජලීය ද්‍රාවණයේදී පහත ආකාරයට $H_3O^+$ සාදන නිසා එය ආම්ලික වේ.

$$H—Cl + H_2O \longrightarrow H_3O^+ + Cl^-$$

**ආවර්තිතා වක්‍රයේ තුන් වන ආවර්තයේ හයිඩ්‍රොක්සිල් සංයෝග**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| හයිඩ්‍රොක්සිල් සංයෝගය | NaOH | $Mg(OH)_2$ | $Al(OH)_3$ | අස්ථායී $Si(OH)_4$ ↓ $-H_2O$ | අස්ථාය $P(OH)_5$ ↓ $-H_2O$ | අස්ථායී $S(OH)_6$ ↓ $-2H_2O$ | අස්ථායී $Cl(OH)_7$ ↓ $-3H_2O$ |
| ස්ථායී සංයෝගය | NaOH | $Mg(OH)_2$ | $Al(OH)_3$ | $H_2SiO_3$ | $H_3PO_4$ | $H_2SO4$ | $HClO_4$ |
| ආම්ලික භාෂ්මික ස්වභාවය | ප්‍රබල භාෂ්මික | දුබල භාෂ්මික | උභය ගුණී | දුබල ආම්ලික | දුබල ආම්ලික | ප්‍රබල ආම්ලික | ප්‍රබල ආම්ලික |

- ආවර්තයේ වමේ සිට දකුණට යන විට හයිඩ්‍රොක්සිල් සංයෝග වල ආම්ලිකතාව වැඩි වන අතර භාෂ්මිකතාව අඩු වේ. මෙය පහත අයුරින් පැහැදිලි කළ හැක.

හයිඩ්‍රොක්සයිඩය M —O — H ලෙස සළකමු.

M—O බන්ධනයේ ධ්‍රැවීයතාවය O —H බන්ධනයේ ධ්‍රැවීයතාවයට වඩා වඩි නම් ජලීය ද්‍රාවණය තුලදී පහත ආකාරයට විඝටනයෙන් මාධ්‍යයට සපයන නිසා හයිඩ්‍රොක්සයිඩය භාෂ්මික වේ.

$$M—O—H \longrightarrow M^+ + OH^-$$

උදා:

$$Na—O—H \longrightarrow Na^+ + OH^-$$

ඒ අනුව ආවර්තයේ වම් පස පිහිටි හයිඩ්‍රොක්සිල් සංයෝගය භාෂ්මික වේ.

M ——O බන්ධනයේ ධ්‍රැවීයතාවය O ——H බන්ධනයේ ධ්‍රැවීයතාවයට වඩා අඩු නම්, එය ජලීය ද්‍රාවණයේදී පහත ආකාරයට විඝටනයෙන් මාධ්‍යයට $H^+$ සපයයි.

$$M—O—H \longrightarrow H^+ + OH^-$$

Find more at: chemistrysabras.weebly.com
twitter: ChemistrySabras

උදා:

$$Cl—O—H \longrightarrow M^{+} + ClO^{-}$$

මේ අනුව ආවර්තයේ දකුණු පස පිහිටි හයිඩ්‍රොසිල් සංයෝගය ආම්ලික වේ.

**ආවර්තිතා වගුවේ දෙවන් හා තුන් වන ආවර්ත වල ඔක්සයිඩ:**

**දෙවන ආවර්තයේ ඔක්සයිඩ**

| ඔක්සයිඩ | $Li_2O$ | BeO | $B_2O_3$ | $CO,CO_2$ | $N_2O$, $NO_2$,<br>$N_2O_3$,$N_2O_5$, $N_2O_4$ | $O_2$ | $F_2O$ |
|---|---|---|---|---|---|---|---|
| භෞතික ස්වභාවය | ඝන | ඝන | ඝන | වායු | $N_2O_5$ ඝන<br>ඉතිරිවා වායු | වායු | වායු |
| ජලය සමඟ ප්‍රතික්‍රියාව | LiOH<br>සාදයි | – | – | CO<br>ප්‍රතික්‍රියා<br>නොකරයි.<br>$CO_2 + H_2O \downarrow H_2CO_3$<br>සාදයි | $N_2O_3+H_2O \rightarrow HNO_3$<br>$N_2O_5+H_2O \rightarrow 2HNO_3$<br>$N_2O$ හා NO<br>ප්‍රතික්‍රියා නොකරයි | – | $F_2O+H_2O \downarrow 2HF+O_2$ |
| බන්ධන ස්වභාවය | අයනික | අයනික | අතරමැදි | සහ සංයුජ | සහ සංයුජ | සහ සංයුජ | සහ සංයුජ |
| අම්ල/ භෂ්ම ස්වභාවය | භාෂ්මික | උභය ගුණී | ආම්ලික | ආම්ලික | ආම්ලික | – | ආම්ලික |

**තුන් වන ආවර්තයේ ඔක්සයිඩ**

| ඔක්සයිඩ | $Na_2O$ | MgO | $Al_2O_3$ | $SiO_2$ | $P_4O_6$, $P_4O_{10}$ | $SO_2$,$SO_3$ | $Cl_2O$,$Cl_2O_3$<br>$Cl_2O_5$, $Cl_2O_7$ |
|---|---|---|---|---|---|---|---|
| භෞතික ස්වභාවය | ඝන | ඝන | ඝන | ඝන | ඝන | වායු | $Cl_2O_7$ ද්‍රව<br>ඉතිරිවා වායු |
| ජලය සමඟ ප්‍රතික්‍රියාව | NaOH | $Mg(OH)_2$ | – | – | $P_4O_6+H_2O \downarrow H_3PO_3$<br>$P_4O_{10}+H_2O \downarrow H_3PO_4$ | $SO_2+H_2O \downarrow H_2SO_3$<br>$SO_3+H_2O \downarrow H_2SO_4$ | $Cl_2O_7+H_2O \rightarrow HClO_4$<br>$Cl_2O_5+H_2O \rightarrow HClO_3$<br>$Cl_2O_3+H_2O \rightarrow HClO_2$<br>$Cl_2O+H_2O \rightarrow HClO$ |
| බන්ධන ස්වභාවය | අයනික | අයනික | අතර මැදි | සහ සංයුජ | සහ සංයුජ | සහ සංයුජ | සහ සංයුජ |
| අම්ල/ භෂ්ම ස්වභාවය | ප්‍රබල භාෂ්මික | දුර්වල භාෂ්මික | උභය ගුණී | දුර්වල ආම්ලික | දුර්වල ආම්ලික | ප්‍රබල ආම්ලික | ප්‍රබල ආම්ලික |

Find more at: chemistrysabras.weebly.com
twitter: ChemistrySabras

- ආවර්තයේ වමේ සිට දකුණට යන විට 3 වන ආවර්තයේ ඔක්සයිඩ වල ආම්ලික ලක්ෂණ වැඩි වන අතර භාෂ්මික ලක්ෂණ අඩු වේ.

## හයිඩ්‍රජන්

**හයිඩ්‍රජන් පිළියෙල කිරීම (කාර්මිකව) :**

I. බොෂ් ක්‍රමය

(ජල වායුව)

$C$ (ශ්වේත තප්ත) $+ H_2O_{(g)} \longrightarrow \overbrace{CO + H_2}$

$CO + H_2 + H_2O_{(g)} \xrightarrow{(Fe_2O_3,\ 500C)} CO_2 + 2H_2$

$CO + 2H_2 \xrightarrow{NaOH} H_2\uparrow + Na_2CO_3$

II. ජලය විද්‍යුත් විච්ඡේදනය

**හයිඩ්‍රජන් පරීක්ෂණාගාරයේදී පිළියෙල කිරීම**

01. ලෝහ තනුක අම්ල සමඟ ක්‍රියා කර වීම.

$Mg + 2HCl$ (තනුක) $\longrightarrow MgCl_2 + H_2$

$Zn + H_2SO_4$ (තනුක) $\longrightarrow ZnSO_4 + H_2$

02. උභය ගුණී ලෝහ තනුක ක්ෂාර සමඟ ක්‍රියා කර වීම.

$2\,Al + 2NaOH + 2H_2O \longrightarrow 2NaAlO_2 + 3H_2$

$Zn + 2NaOH \longrightarrow Na_2ZnO_2 + H_2$

03. Na හා Ca වැනි ලෝහ ජලය සමඟ ක්‍රියා කර වීම.

$2Na + 2H_2O \longrightarrow 2\,NaOH + H_2$

$Ca + 2H_2O \longrightarrow Ca(OH)_2 + H_2$

04. අයනික හයිඩ්‍රයිඩ ජලය සමඟ ක්‍රියා කර වීම.

$2\,NaH + 2H_2O \qquad 2NaOH + H_2$

$MgH_2 + 2H_2O \qquad Mg(OH)_2 + H_2$

**හයිඩ්‍රජන් වල ගුණ**

- අවර්ණ, ගන්ධයක් රහිත වායුවකි.
- ජලයේ ද්‍රාවණය වන්නේ ඉතා මඳ වශයෙනි.
- Pt, Pd වැනි ලෝහ වලට $H_2$ වායුව අධිශෝෂණය වේ.
- හයිඩ්‍රජන් ඔක්සිකාරයක් මෙන්ම ඔක්සිහාරකයක් ලෙසද ක්‍රියා කල හැක.

Find more at: chemistrysabras.weebly.com
twitter: ChemistrySabras

**H හි ඔක්සිකාරක ප්‍රතික්‍රියා**

$$H_2 + 2Na \longrightarrow 2NaH$$

$$H_2 + Sn \longrightarrow SnH_2$$

**H හි ඔක්සිහාරක ප්‍රතික්‍රියා**

$H_2 + Cl_2$ (සූර්යාලෝකය) $\longrightarrow 2HCl$

$$2H_2 + O_2 \xrightarrow{Pt} 2H_2O$$

$$H_2 + S \xrightarrow[\Delta]{} H_2S$$

$$PbO + H_2 \xrightarrow[\Delta]{} Pb + H_2O$$

**හයිඩ්‍රජන් ආවර්තිතා වගුවේ I A කාණ්ඩයේ මූලද්‍රව්‍යයක් ලෙසද VII A කාණ්ඩයේ මූල ද්‍රව්‍යයක් ලෙසද වර්ගීකරණය කරයි.**

**H , I A කාණ්ඩය යටතේ වර්ගීකරණය කිරීමට හේතු:**

01. අවසාන ශක්ති මට්ටමේ ඉලෙක්ට්‍රෝන 1 ක් පැවතීම.
02. ඒකාරෝපිත ධන අයන තැනීම.
03. සංයුජතාව හා ඔක්සිකරණ අංකය +1 පෙන්වීම.
04. හැලජන වැනි අලෝහ සමඟ සංයෝජනය වීම.
05. විද්‍යුත් විච්ඡේදනයේදී කැතෝඩය අසලින් මුක්ත වීම.

**H , VII A කාණ්ඩය යටතේ වර්ගීකරණය කිරීමට හේතු:**

01. ස්ථායී උච්ඡ වායු වින්‍යාසයන් කරා ළඟා වීමට ඉලෙක්ට්රෝන එකක් අඩු වීම,
02. ඒකාරෝපිත සෘණ අයන තැනීම.
03. සංයුජතාව හා ඔක්සිකරණ අංකය -1 පෙන්වීම.
04. ක්ෂාර ලෝහ වැනි ලෝහ සමඟ සංයෝජනය වීම.
05. ද්වි පරමාණුක අණු වශයෙන් පැවතීම.
06. විද්‍යුත් විච්ඡේදනයේදී ඇනෝඩය අසලින් මුක්ත වීම.

**හයිඩ්‍රජන් වල ප්‍රයෝජන**

01. අසංතෘප්ත තෙල් හා මේද සංතෘප්ත කිරීම. (බටර්, මාගරින් නිෂ්පාදනය)
02. HCl නිෂ්පාදනය
03. $NH_3$ නිෂ්පාදනය
04. අහස් යානා බැලූන
05. ඉන්ධන ලෙස
06. මෙතනෝල් නිෂ්පාදනය

**ඩියුටීරියම් (බැර හයිඩ්‍රජන්)**

Find more at: chemistrysabras.weebly.com
twitter: ChemistrySabras

හයිඩ්‍රජන් වල ස්කන්ධ ක්‍රමාංකය දෙක වන සමස්ථානිකය ඩියුටීරියම් ලෙස හඳුන්වයි. ($^{2}_{1}H$) $^{2}_{1}H = D$

**HD වායුව පිළියෙල කිරීම.**

$$NaD + H_2O \longrightarrow NaOH + HD\uparrow$$

$$NaH + D_2O \longrightarrow NaOD + HD\uparrow$$

Find more at: chemistrysabras.weebly.com
twitter: ChemistrySabras